පවත්නා කොවිඩ්-19 ගෝලීය ව්‍යාප්ත වසංගත තත්වය සමගින්, සෞඛ්‍ය අංශ මගින් නිර්දේශ කොට ඇති මූලික නිවාරණ උපායයන් සහ රෙගුලාසි පිළිපැදීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වගකීම මාධ්‍ය වෙතද පැවරේ. එම වගකීම සෑම මාධ්‍යයක්ම පාහේ බරපතළ ලෙසින් සලකා ඉටු කරමින් සිටී. කෙසේ වෙතත් ඇතැම් මාධ්‍ය තමන්ට පැවරී ඇති එම වගකීම් සීමාවෙන්ද එපිටට ගොස්, පුරවැසියන් "කකුල් දෙකෙන් එල්ලා තැබීමටද" යෝජනා කරයි. උදාහරණ ලෙසින් දිවයින ඉරිදා සංග්‍රහයේ (05/09) කතුවැකිය දැක්විය හැක. එහි මුඛ ආවරණ නැතිව ප්‍රසිද්ධ ස්ථානවල හෝ වාහනවල යනෙන අය අල්ලා දවස් දාහතරක් නිවෙස් තුළ නිරෝධායනය කිරීමට ආණ්ඩුව සැරසෙන බව පවසා, ඉන් පසුව "නිර්දේශ" කොට සිටින්නේ එවන් අය අල්ලා "දවස් දාහතරක් කකුල් දෙකෙන් එල්ලා තැබිය යුතු" බවටයි.

පුවත්පතක කතුවැකියක් යනු මත නිර්මාණය කරන්නකි. එය එම පුවත්පතේ මතය ලෙසින්ද සැලකේ. එම පසුතලයේදී පුවත්පත් කතුවැකියක් ආවාට ගියාට ලිවීමට නොහැකි අතර, එම කතුවැකිය විශාල සමාජ වගකීමක්ද දරයි. එවැනි කතුවැකියකින් මිනිසුන්ට වධ හිංසා පැමිණවීම ප්‍රවර්ධනය කිරීම බරපතළ ගැටළුවක් නොවේදැයි අප ඇසිය යුතුයි.

මිනිසුන් "කකුල් දෙකෙන් එල්ලා තබන්නට" යෝජනා කරන මෙම දිවයින කතුවැකිය සම්බන්ධයෙන් ඔබ දරණා අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina